# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1776/41 - 2012 සැප්තැම්බර් මස 21 වැනි සිකුරාදා - 2012.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත

2 වැනි වගන්තිය යටතේ නියමයන්

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ විෂයභාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් කොටස නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා වහා අවශ්‍ය ව ඇති බව මාගේ මතය වන හෙයින්, අදාළ ඉඩම් කොටස එකී කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2012 සැප්තැම්බර් මස 17 වැනි දින,
15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 498 සී මාකුඹුර දකුණ හා 498 ඒ මාකුඹුර උතුර ග්‍රාම නිළධාරි කොට්ඨාස තුළ මාකුඹුර ගමේ පිහිටි, බලයලත් ලියාපදිංචි මිනින්දෝරු අයි. ඒ. විජේතිලක මහතා විසින් මැන පිළියෙළ කරන ලද අංක 2784 හා 2010.12.31 දින දරන සැළසුමේ කැබලි අංක 01 හා 02 ලෙස පෙන්නුම් කෙරෙන හෙක්ටෙයාර් 8.79194 ක් පමණ වන මාකුඹුරවත්ත නැමැති ඉඩම් කොටසට මායිම්.

**කැබලි අංක 01** - (හෙක්ටයාර් 5.32350)

| | | |
|---|---|---|
| උතුරට | : | අඩි පාර, කේ.ආර්. සිරිවර්ධන මහතා හා තවත් අය හිමිකම් කියන ඉඩම ; |
| නැගෙනහිරට | : | කේ.එච්.ඩී. චාන්දනී හා ජයලත් ඉංජිනියරින් හිමිකම් කියන ඉඩම ; |
| දකුණට | : | හයිලෙවල් පාර හා ප්‍රියංගනී පෙරේරා හිමිකම් කියන ඉඩම ; |
| බටහිරට | : | ප්‍රියංගනී පෙරේරා සුනිල් ශාන්ත හා තවත් අය හිමිකම් කියන ඉඩම. |

**කැබලි අංක 02** - (හෙක්ටයාර් 3.46844)

| | | |
|---|---|---|
| උතුරට | : | හයිලෙවල් පාර හා ව.අ. 321/2, 416 හා 416 ඒ දරන දේපළ ; |
| නැගෙනහිරට | : | හයිලෙවල් පාර, කනත්ත හා දොලේකඩේ මාකුඹුර මාර්ගය ; |
| දකුණට | : | ඩී. ඩී. කුලතුංග මාවත ; |
| බටහිරට | : | ව.අ. 418/7 කුලතුංග මාවත හා එච්.එල්.රත්නසිරි හිමිකම් කියන ඉඩම. |

10-362

1A - G 016640 — 340 (2012/09)

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

15(1) වැනි වගන්තිය යටතේ නියෝගය

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 15(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ජා ඇල නගර සභාව සතු මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම් කොටස් අද දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාඇල ජයන්ති විද්‍යාල ක්‍රීඩාංගන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙම නියෝගය මගින් සතු කරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 17 වැනි දින,
15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 190 A වැලිගම්පිටිය උතුර ග්‍රාම නිළධාරි වසමට අයත් ජාඇල නගර සභා සීමාව තුළ පිහිටි සර්වේ ජනරාල්ගේ 2011.03.12 දිනැති මු.පි.ගම්. 3686 හි කැබලි අංක 11, 12 සහ 14 දරන ප්‍රමාණයෙන් අක්. 0 රූඩ්. 0 පර්. 16 ක් වූ (හෙක්ටෙයාර් 0.0408) බිම් ප්‍රමාණයෙන් සමන්විත පූවෙල නැමති ඉඩම් කොටස් 3 සඳහා මායිම්.

**කැබලි අංක 11** - (ප්‍රමාණය හෙක්ටයාර් 0.0002)

| | | |
|---|---|---|
| උතුරට | : | මෙම පිඹුරේ කැබලි අංක 06, 10, 12 සහ කේ. ජේ. ප්‍රනාන්දු හිමිකම් කියන යූ. සී. වත්ත ; |
| නැගෙනහිරට | : | කේ. ජේ. ප්‍රනාන්දු හිමිකම් කියන යූ. සී. වත්ත සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| දකුණට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස සහ නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන පූවෙල ඉඩම ; |
| බටහිරට | : | මෙම පිඹුරේ කැබලි අංක 12 සහ නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන පූවෙල. |

**කැබලි අංක 12** - (ප්‍රමාණය හෙක්ටයාර් 0.0324)

| | | |
|---|---|---|
| උතුරට | : | මෙම පිඹුරේ කැබලි අංක 03, 06, 10 ; |
| නැගෙනහිරට | : | මෙම පිඹුරේ කැබලි අංක 10, 11, 14 නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන පූවෙල, ජාඇල නගර සභාව හිමිකම් කියන පූවෙල ; |
| දකුණට | : | මෙම පිඹුරේ කැබලි අංක 14, ගම් 1638 මූලික පිඹුරේ කැබලි අංක 05 සහ ගම් 3219 මූලික පිඹුරේ කැබලි අංක 01 ; |
| බටහිරට | : | ගම් 3219 පිඹුරේ කැබලි අංක 01 මෙම පිඹුරේ කැබලි 03 සහ 13. |

**කැබලි අංක 14** - (ප්‍රමාණය හෙක්ටයාර් 0.0082)

| | | |
|---|---|---|
| උතුරට | : | මෙම පිඹුරේ කැබලි අංක 12 සහ නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන පූවෙල ; |
| නැගෙනහිරට | : | නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන පූවෙල, සහ A 3116 මූලික පිඹුරේ කැබලි අංක 02 ; |
| දකුණට | : | A 3116 මූලික පිඹුරේ කැබලි අංක 02 සහ ගම් 1638 මූලික පිඹුරේ කැබලි අංක 05 ; |
| බටහිරට | : | ගම් 1638 මූලික පිඹුරේ කැබලි අංක 05, ගම් 3219 මූලික පිඹුරේ කැබලි අංක 01, 12 සහ 13. |

10-363

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.